# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.24 පැය 1455 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 828 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - දෙහිවල පොලිස් වසම**

2025.04.23 වන දින දෙහිවල පොලිස් වසමේ කළුබෝවිල ප්‍රදේශයේදී දෙහිවල පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් අනුව අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුගෙන් වැඩිදුර ප්‍රශ්ණ කිරීමේදී පහත අපරාධයන් සිදු කර ඇති බවට අනාවරණය වී ඇත.

1. 2025.04.20 වන දින දෙහිවල පොලිස් වසමේ වෙළෙඳසැලක් බිඳ රුපියල් 245,660/= වටිනා මුදල් හා භාණ්ඩ සොරා ගැනීම හා එදිනම වෙළෙඳසැලක් බිඳ රුපියල් 73,054/- ක් වටිනා දේපළ සොරකම් කිරිම.

2. 2025.04.09 වන දින ගල්කිස්ස පොලිස් වසමේ වෙළෙඳසැලක් බිඳ රුපියල් 65,000/= ක දේපළ සොරා ගැනීම.

3. 2025.02.17 වන දින දෙහිවල පොලිස් වසමේ ආයතනයක් බිඳ රුපියල් 256,000/- ක මුදලක් සොරකම් කිරීම.

**සැකකරු වයස අවුරුදු 46 ක් වූ කළුබෝවිල පාර, දෙහිවල ප්‍රදේශයේ පදංචිකරුවෙකු වේ.**

දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

මෙයට අදාළ ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**02. මාරක රිය අනතුරක් - අඹන්පොල පොලිස් වසම.**

2025.04.24 වන දින උදෑසන කාලයේ අඹන්පොල පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර ඒ- 28 ප්‍රධාන මාර්ගයේ අඹන්පොල ජාතික පාසල ඉදිරිපිටදී අනුරාධපුර දෙස සිට පාදෙණිය දෙසට ධාවනය වූ බස් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල

ලැබූ ත්‍රීරෝද රථයේ ගමන් කළ පුද්ගලයින් දෙදෙනා ප්‍රතිකාර සඳහා අඹන්පොල රෝහලට ඇතුලත් කිරීමේදී එක් පුද්ගලයෙකු මිය ගොස් ඇති අතර අනෙක් පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අඹන්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - ඇහැටුවැව පොලිස් වසම.

2025.04.24 වන දින අළුයම් කාලයේ ඇහැටුවැව පොලිස් වසමේ කදුරුවැව, ප්‍රදේශයේ ගෙවත්තකට පැමිණි වන අලියෙකු නිවසේ හිමිකරු විසින් පලවා හැරීමට යාමේදී එම පුද්ගලයාට වන අලියා පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට ඇහැටුවැව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ ඇහැටුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඇහැටුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**